# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2120/17 – 2019 අප්‍රේල් 25 වැනි බ්‍රහස්පතින්දා – 2019.04.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2002 අප්‍රේල් මස 29 වැනි දින අංක 1234/9 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2002 අංක 39 දරන ආඥාවේ ඇතුළත්, ඉඩම් කොටස් සම්පූර්ණයෙන්ම රජය සතුවී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වන වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස් වල සන්තකය ද ලබා ගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම එකී ඉඩම් කොටස් අතුරින් පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: LD/05/2001/HW/STDP/JBIC/177.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: මහ/1/286/අත්.
2019 මාර්තු මස 21 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාකුඹුර (මහරගම නගරසභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක පීපී කො. 8542 දරන මූලික පිඹුරේ පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම් :

01. **කැබලි අංක 207 – දෙල්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0316**

උතුරට: කැබලි අංක 205, 204 සහ ඕ. ඩී. පෙරේරාගේ දෙල්ගහවත්ත; නැගෙනහිරට: ප්‍රභාත් මංජුලගේ දෙල්ගහවත්ත; දකුණට: සිලෝන් බිස්කට් ලිමිටඩ්ගේ දෙල්ගහකුඹුර, කැබලි අංක 67 සහ ඇළ; බටහිරට: කැබලි අංක 206.

05 - 116

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ ආඥාව අවලංගු කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දා වූ ද, අංක 1659/10 හා 2010.06.22 වැනි දින දරන රජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දා වූ ද, 2010 අංක 94 හා 2010.06.11 වැනි දින දරන ආඥාවේ පහත සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් මේ

1A – G29915 – 56 (2019/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කියන ලද ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් භාරගෙන නැත. එබැවින්, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වැනි වගන්තිය යටතේ මාහට පැවරී ඇති බලතල අනුව අංක 1659/10 හා 2010.06.22 වැනි දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2010 අංක 94 හා 2010.06.11 වැනි දින දරන ආඥාව මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: LD/05/2007/PISD/17.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: වැදි/3/ඉ.අ./මා.මැ.
2019 අප්‍රේල් මස 09 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැලිවිටිය-දිවිතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අකුරැටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ජීඒ/ඩබ්ලිව්ඩීටී/08/142 හා 2008.06.30 වැනි දින දරන ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්න් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම් :

01. **කැබලි අක්ෂර 'බී' – මී මැඩුම සනිසයිඩ් ඉඩමේ කොටසක් – ප්‍රමාණය: හෙක්. 6.475**

උතුරට: නමුණුකුල ඉඩම සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ සහ ජලපොම්පාගාර පාර; නැගෙනහිරට: ජලපොම්පාගාර පාර සහ ආරාම පාර; දකුණට: ආරාම පාර, මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර සී, එම්. පී. සෝමවතී, බී. ඒ. අනුලාවතී සහ තවත් අය හිමිකම් කියන හත්හවුලවත්ත, බී. ඒ. ශාන්ත සහ තවත් අය හිමිකම් කියන උඩුමුල්ලවත්ත සහ මාර්ගය; බටහිරට: බී. ඒ. අනුලාවතී සහ තවත් අය හිමිකම් කියන හත්හවුලවත්ත, බී. ඒ. ශාන්ත සහ තවත් අය හිමිකම් කියන උඩුමුල්ලවත්ත, මාර්ගය සහ නමුණුකුල ඉඩම.

05 - 117

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.